# ලංසු සඳහා ආරාධනයයි `

## වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## <u>මූලික රෝහල් සඳහා දියර ඔක්සිජන් ටැංකි මිළදී ගැනීම 2021 වර්ෂය</u>

වයඹ පළාත තුල පිහිටී මාරවිල . පුත්තලම , දඹදෙණිය හා නිකවැරටිය යන රෝහල් සඳහා දියර ඔක්සිජන් ටැංකි සැපයීම, ස්ථාපනය කිරීම,ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා 2021 අගෝස්තු මස 30 වෙනි දින පෙ.ව. 9.00 සිට 2021 සැප්තැම්බර් මස 14 දින පෙ.ව 10.00 දක්වා පහත සඳහන් පරිදි මුද්‍රා තැබූ ලංසු අයදුම්පත් මෙයින් කැදවනු ලැබේ.

| අනු අංකය | රෝහල | ධාරිතාව | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රුපියල්) | ලංසු ඇපකරයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | මූලික රෝහල නිකවැරටිය | 6000 L | 3500.00 | 200000.00 |
| 02 | මූලික රෝහල පුත්තලම | 6000 L | 3500.00 | 200000.00 |
| 03 | මූලික රෝහල මාරවිල | 3000 L | 1000.00 | 150000.00 |
| 04 | මූලික රෝහල දඹදෙණිය | 3000 L | 1000.00 | 150000.00 |

02. කුරුණෑගල , මිගමුපාර, වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් අයකැමි වෙත 2021 අගෝස්තු මස 30 වන දින සිට 2021 සැප්තැම්බර් මස 13 වන දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ඉහත සඳහන් ලංසු ගාස්තුවක් ගෙවා ලංසු ලියවිලි ලබාගත හැකි අතර. ලංසු ලියවිලි රජයේ වැඩ කරන ඉහත දින හා වේලාවන් තුල නොමිලේ පරික්ෂා කළ හැක.

03. මුද්‍රා තබන ලංසු අයදුම්පත් බහාලු කවරේ වම්පස ඉහල කෙලවරේ " **<u>Supply, Delivery , Installation, Testing ,Commissioning and Maintenance of Cryogenic liquid Oxygen Storage for Base Hospitals</u>** " යනුවෙන් සටහන්කර 2021 සැප්තැම්බර් මස 14 වන දින පෙ.ව 10.00 පෙර ප්‍රධාන ගණකාධිකාරි, වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මිගමු පාර, පුවක්ගස්හංදිය, කුරුණෑගල, යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ උක්ත ලිපිනයෙහි ගිණුම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම සිදුකල හැකිය.

04. 2021සැප්තැම්බර් මස 14 වන දින පෙ.ව 10.05 ට වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගී විය හැකිය.

05. මෙම ලංසු පිළිබඳ වැඩි තොරතුරු 037-2223231,037-2223479 යන දුරකථන අංක අමතා වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරිගෙන් විමසිය හැක.

සභාපති

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

වයඹ පළාත , කුරුණෑගල